ආබාධ සහිත කාන්තාවන්ගේ සංගමයේ ව්‍යවස්ථා සංග්‍රහය

1, **සංවිධානයේ නම** :- ආබාධ සහිත කාන්තාවන්ගේ සංගමය

2, **ලිපිනය :-** :- "ආකාස",පහලගම පාර,කෝන්ගොල්ලෑව, තලාව.

3, **බල ප්‍රදේශය** :- ශ්‍රී ලංකාවේ භූමි ප්‍රදේශය

4, **ව්‍යවස්ථා නාමය** :- මෙම ව්‍යවස්ථාව ශ්‍රී ලංකා ආබාධ සහිත කාන්තාවන්ගේ සංගමයේ ව්‍යවස්ථා සංග්‍රහය නමින් හැඳින්වේ මින් මතු මෙම ව්‍යවස්ථා සංග්‍රහය ව්‍යවස්ථාව නමින් ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් වනු ඇත.එමෙන්ම මෙම සංගමයේ කෙටි නම "ආකාස" යනුවෙන් හැඳින්වෙනු ඇත.

5, **ව්‍යවස්ථාව වලංගු කාල සීමාව,**

වෂර් 2022 ඔක්තෝබර් මස 13 වන දින තලාව ආබාධ සහිත කාන්තාවන්ගේ සංගමයේ මූලස්ථානයේ පවත්වන ලද මෙම සංගමයේ මහා සභා රැස්වීමේදී එවකට භාවිතයේ පැවති 2001.04.02 සම්මත කරගන්නා ලද ව්‍යවස්ථා සංග්‍රහය නව යෝජනා ඇතුලත් කිරීම සඳහා නැවත වරක් සංසෝධනය කිරීමට මහා සභාව ගත් තීරණයට අනුව මෙම ව්‍යවස්ථාව එම සංසෝධනයන් සමග ඉදිරියට ක්‍රියාත්මක වන බවත් 2001 වෂර්යේ සම්මත කරගන්නා ලද ව්‍යවස්ථාවේ යම් යම් කරුණු වෙනස් වන බවත් නව කරුණු ඇතුලත් වන බවත් 2024.12.21.වන දින මහා සභාව විසින් තීරණය කරන ලදී. මින් ඉදිරියට මෙම ව්‍යවස්ථාව ඒ අනුව ක්‍රියාත්මක වේ.

වෂර් 2001.අප්‍රේල් මස 02 වන දින තලාව ආබාධ සහිත කාන්තාවන්ගේ සංගමයේ මූලස්ථානයේදී පවත්වන ලද මෙම සංගමයේ මහා සභා රැස්වීමේදී, එවකට භාවිතාවේ පැවති 1995.12.30 වන දින සම්මත කර ගන්නා ලද ව්‍යවස්ථා සංග්‍රහය නව යෝජනාවන්ට නොගැලපෙන බැවින් එය අවලංගු හා බල රහිත බවට පත් කිරීමට තීරණය කරන ලදී.ඒ අනුව 1995.12.30 වන දින සම්මත වූ ව්‍යවස්ථාව 2001.අප්‍රේල් මස 02 වන දින දක්වා වලංගුව පැවති බවටත් 2001. 04.02 වන දින සිට නැවත සංගමයේ මහා සභා රැස්වීමකදී කරන ලද සංශෝධනයන්ට යටත්ව හෝ එසේ නොමැති නම් අඛණ්ඩව බල සහිතව ක්‍රියාත්මකවේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය අවලංගු කල හැක්කේ හෝ සංශෝධනය කල හැක්කේ සංගමයේ මහා සභා රැස්වීමකදී සංගමයේ සාමාජිකත්වයේ පොදු එකඟතාවය මත හෝ මුළු සාමාජික සංඛ්‍යාවෙන් 50% වැඩි දෙනෙකුගේ කැමැත්ත මත පමණි

මෙම ව්‍යවස්ථාවේ අඩංගු සියලු විවිධ විධානයන් ආබාධ සහිත කාන්තාවන්ගේ සංගමයේ සියලුම සාමාජිකාවන් සංගමයේ සියලු නිලධාරින් සේවකයින්,පාශර්කරුවන්, මැදිහත්කරුවන්,සම්බන්ධතා ඇති ආයතන හා පුද්ගලයන්,හා නියෝජිතයන් කෙරෙහි බල පැවැත්වේ.මෙම සංගමයේ සාමාජිකත්වය දරන දිස්ත්‍රික් සංගමයන් ,ප්‍රාදේශීය සංවිධාන,ග්‍රාමීය සමිති හා කුඩා කණ්ඩායම්වලට,ගැලපෙන පරිදි අතුරු ව්‍යවස්ථා සම්මත කර ගත හැකි අතර ඒ කිසිදු අතුරු ව්‍යවස්ථාවක කිසිදු ප්‍රතිපාදනයක් මගින් මෙම ව්‍යවස්ථාවේ කිසියම් ප්‍රතිපාදනයක් උල්ලංඝනය විය යුතු නොවේ.

06. **දර්ශනය** සියලු දෙනාටම සමාන හිමිකම් ඇති සමාජයක්.

07. **පරමාර්ථය.**

ශ්‍රී ලංකාවේ ආබාධ සහිත පුද්ගලයන් විශේෂයෙන් ආබාධ සහිත කාන්තාවන් සමාජ ආර්ථික දේශපාලන, අධ්‍යාපනික,සංස්කෘතික වශයෙන් සමාජයේ පීඩාවන්ට පත් වීමෙන් වැළකීම සඳහා ඔවුන්ටත් සමාජයේ සම අවස්ථාවන් දිනා ගැනීම සඳහාත්

ආබාධ සහිත පුද්ගලයන්ද විශේෂයෙන් ආබාධ සහිත කාන්තාවන්ද ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් හා රටේ සාමාන්‍ය ජනතාවටද ආබාධ සහිත පුද්ගලයන් ගැන දැනුවත්වීම,තේරුම් ගැනීම,ඔවුන් ගැන සැලකිලිමත්වීම,හා ඔවුන්ට නිදහස් ජීවිතයකට මග පෙන්වීම.

08, **අරමුණු. :-**

- ආබාධ සහිත කාන්තාවන් බලපෑම් කණ්ඩායමක් ලෙස සංවිධානය වීම,
- ආබාධ සහිත කාන්තාවන්ගේ ආකල්ප වෙනස් කිරීම ,ඔවුන් දිරිමත් කිරීම,පුනරුත්ථාපනය කිරීම,ආබාධ සහිත වීම , අවම කිරීම, සඳහා ක්‍රියා මාගර් ගැනීම.
- ආබාධ සහිත කාන්තාවන්ගේ දක්ෂතාවයන් කුසලතාවයන් හා නායකත්වය සංවධර්නය කිරීම.
- ආබාධ සහිත කාන්තාවන් පිලිබඳව ඔවුන්ගේ පවුල් හා සමාජය දරන ආකල්ප වෙනස් කිරීම.
- ආබාධ සහිත කාන්තාවන්ට ස්වාධීන නිවහල් දිවි පවතක් ගත කිරීම සඳහා හිමිවිය යුතු වරප්‍රසාද හා අයිතිවාසිකම් ලබා ගැනීම සඳහා අවශ්‍ය පසුබිම සකස් කිරීම

09, **මෙහෙවර :-**

ශ්‍රී ලංකාවේ ආබාධ සහිත පුද්ගලයන් විශේෂයෙන් ආබාධ සහිත කාන්තාවන් සමාජ ආථර්ක දේශපාලන, අධ්‍යාපනික,සංස්කෘතික වශයෙන් ඇතිවන පීඩාවන් වලක්වා ගනිමින්ද ඔවුන්ගේ හැකියාවන් කුසලතාවයන් වධර්නය කර ගනිමින්ද සමාන අයිතීන් ලබා ගනිමින්ද ඔවුන්ට නිදහස්ව ස්වාධීනව ජීවත් වීම සඳහා අවකාශ සලසා ගැනීමට සහය වීම.

10,ආබාධ සහිත කාන්තාවන්ගේ සංගමය පාලනය කරන මුලධර්ම:-

- ආබාධ සහිත කාන්තාවන්ගේ ස්වශක්තිය කෙරෙහි විශ්වාසය තැබීම හා ඒ මත රඳා සිටීම.
- මානව ගරුත්වය හා සමාජ සාධාරණත්වය.
- සංවිධානයේ සියලුම ක්‍රියාකාරකම් ආබාධ සහිත කාන්තාවන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සජීවිකරණය හා බලගැන්වීම කෙරෙහි යොමු විය යුතු වීම.
- ආබාධ සහිත කාන්තාවන් සම්බන්ධයෙන් තීරණ ගැනීම,තීරණ ක්‍රියාත්මක කිරීම,හා ක්‍රියාමාගර් නිවැරදි කර ගැනීම, ආබාධ සහිත කාන්තාවන්ගේ සංගමයේ සාමාජිකාවන්ට පමණක් සිදුකිරීම.
- ආබාධ සහිත කාන්තාවන්ගේ සංගමයේ සියලු කටයුතු දශර්නය,පරමාථර්ය,අරමුණු ලඟා කරගැනීම සඳහා පමණක් ක්‍රියාත්මක කල යුතුවේ.

11 ,**සාමාජිකත්වය,**

1995 ක් වූ දෙසැම්බර් මස 30 වන දින වන විට ආබාධිත කාන්තාවන් පුනරුත්තාපනය කිරීමේ සංගමයේ සාමාජිකත්වය දැරූ සියලුම සාමාජිකාවන්ට හා 1995.12.30 වන දින රැස්වූ නව සාමාජිකාවන් හා ආබාධ සහිත කාන්තාවන්ට මෙම සංගමයේ සාමාජිකත්වය හිමි විය යුතුය.නව සාමාජිකාවන් මෙම සංගමයට බැඳීමේදී ඉල්ලුම් පත්‍රයක් විධායක මණ්ඩලයේ ලේකම් වෙත ඉදිරිපත් කලයුතුවේ.විධායක මණ්ඩලයෙන් කරනු ලබන කරුණු සොයා බැලීමකින් අනතුරුව සාමාජිකත්වයට බැඳීමට ඉඩ දුනහොත් මහා සභාව විසින් තීරණය කරගන්නා ලද මුදලක් ගෙවා හෝ එසේ ගෙවීමට හැකියාවක් නොමැති අය මහා සභාවේ තීරණය මත නොගෙවා හෝ සාමාජිකාවක් ලෙස ලියාපදිංචි වීමට හිමිකම ලැබේ.

12,සාමාජිකත්වය සඳහා සුදුසුකම් :-

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- ආබාධ සහිත කාන්තාවක් වීම.
- නිත්‍ය සාමාජිකත්වය හා ප්‍රතිලාභී සාමාජිකත්වය ලෙස සාමාජිකත්වය පිරි නැමීම.
- ප්‍රතිලාභී සාමාජිකයන්ට සංවිධානයේ ප්‍රතිලාභ අත්පත් කර ගැනීමට හැකියාව ඇත.
- මහා සභාවේ හෝ විධායක සභාවේ තීරණයන් ගැනීම හා ක්‍රියාත්මක කිරිම සඳහා සහභාගී විය හැකි අබාධ සහිත තත්වයන්ගෙන් පෙලෙන කාන්තාවන්ට, එසේ තීරණයන් ගැනීම හා ක්‍රියාත්මක කිරීමට නොහැකි ආබාධ සහිත කාන්තාවන්ගේ කාන්තා භාරකරුවෙකුට හා පිරිමි ආබාධ සහිත පුද්ගලයන්හටද ප්‍රතිලාභී සාමාජිකත්වය හිමිවේ.
- නව සංසෝධනයන්ට අනුව ආබාධිතතාවය පිලිබඳ අවබෝධය,එම ක්ෂේත්‍රයේ කටයුතු කර තිබීම සහිත ආබාධ නොවන කාන්තාවන් සීමිත ප්‍රමාණයක් (10 දෙනෙකුට සාමාජිකත්වය හිමිවේ.
- ඔවුන්ගේ සුදුසුකම් අනුව විධායක මණ්ඩලයටද පත්විය හැක.

13,**සාමාජික වගකීම**

- ආබාධ සහිත කාන්තාවන්ගේ සංගමයේ ව්‍යවස්ථාව අනුව කටයුතු කිරීම හා එහි අරමුණු ලඟා කරගැනීම සඳහා කටයුතු කිරීම.
- ආබාධ සහිත කාන්තාවන්ගේ සහ ප්‍රතිලාභී සාමාජිකයන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් නිරතුරුව පෙනී සිටීම.

14,සාමාජික වරප්‍රසාද

- ඍජු සාමාජිකත්වය හිමි කාන්තාවකට සංගමයේ ඕනෑම තනතුරකට අයදුම් කිරීමට බලය ඇත.
- ඍජු සාමාජිකාවන් සඳහා ආබාධ සහිත කාන්තාවන්ගේ සංගමය විසින් ආබාධ සහිත කාන්තාවන් උදෙසා ලබා දෙන යම් පොදු ප්‍රතිලාභයක් වේ නම් ඒ සඳහා අයදුම් කල හැකි අතර විධායක සභාවේ තීරණය පරිදි එම ප්‍රතිලාභ හිමි කර ගත හැකිය.
- ප්‍රතිලාභ සාමාජිකයෙකු ආබාධ සහිත කාන්තාවන්ගේ සංගමයේ ප්‍රතිලාභ ලැබීමේ හිමිකම ලබයි.

15,සාමාජික මුදල්

- සාමාජික මුදල් මහා සභාව තීරණය කරගත් පරිදි සිදු කල යුතුය.ඒ අනුව සෑම සභාවකදීම සාමාජික මුදල් පිලිබඳ සංසෝධන සිදු කල හැකිය.

16,සාමාජිකත්වය අහිමි වීම,

- කිසියම් සාමාජිකාවක් සංගමයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා කිසියම් අයුරකින් දායක නොවන බවට විධායක මණ්ඩලය සෑහීමකට පත් වුවහොත් ඇය ගේ සාමාජිකත්වය අහෝසි කිරීමට විධායක මණ්ඩලයට බලය තිබිය යුතුය.සාමාජිකත්වය අහෝසි කල බැව් එසේ අහෝසි කිරීමට තීරණ ගන්නා ලද දින සිට දින 30ක කාලයක් ඇතුලත සාමාජිකත්වය අහිමි වූ අය වෙත දැනුම් දීම විධායක මණ්ඩලයේ ගරු ලේකම් වරියගේ වගකීම වේ.

- තමන්ගේ සාමාජිකත්වය අහෝසි කල බවට විධායක මණ්ඩලයේ දැනුම් දීම ලැබුන සාමාජිකාවක සිටි කාන්තාවකට දින 60ක කාලයක් තුලදී තමන්ගේ තමන්ගේ සාමාජිකත්වය අහෝසි කිරීමට එරෙහිව අභියාචනයක් සංගමයේ බුද්ධි මණ්ඩලයේ සාමාජිකයෙකු වෙත ඉදිරිපත් කිරීමට හිමිකම තිබිය යුතුය.අවශ්‍ය කරුණු විමසා බැලීමෙන් අනතුරුව අභියාචනාකරු නැවත සංගමයේ සාමාජිකත්වයට බඳවා ගැනීමට නිදෙර්ශයක් කිරීමට බුද්ධි මණ්ඩලයට හිමිකම තිබේ.නමුත් බුද්ධි මණ්ඩලයේ නිදෙර්ශය ක්‍රියාත්මක කිරීම හෝ නොකිරීම විධායක් මණ්ඩලයේ වගකීම විය යුතුය.

- සංගමයෙන් පිටතදී සංගමය පිලිබඳ විවේචනයට ලක් කිරීම.

- සංගමයේ නීති රීති උල්ලංගණය කිරීම.

17,විධායක මණ්ඩලය

වෂර් දෙකකට වරක් පවත්වනු ලබන මහා සභා රැස්වීමේදී විධායක මණ්ඩලය තෝරා ගත යුතුය.

විධායක මණ්ඩලයේ සංයුතිය පහත දැක්වේ.

- ගරු,සභාපතිනි.
- ගරු උප සභාපතිනි.
- ගරු ලේකම්තුමිය.
- ගරු උප ලේකම් තුමිය.
- ගරු භාණ්ඩාගාරික තුමිය
- ගරු උප භාණ්ඩාගාරික තුමිය
- පස් දෙනෙකුගෙන් සමන්විත කාරක සභාව

18,විධායක සභාවේ පොදු කරුණු ,

- විධායක මණ්ඩලය විසින් මහා සභාව වෙනුවෙන් සියලු බලතල ක්‍රියාත්මක කරනු ලබන අතර සියලු වගකීම් දරනු ලැබේ.විධායක මණ්ඩලයේ සාමාජිකාවන් සංගමයේ නිලලත් පාලකවරියන් ලෙස කටයුතු කල යුතුය.

- විධායක මණ්ඩලයේ කිසිදු සාමාජිකාවකට මෙම ව්‍යවස්ථාවේ අඩංගු විධි විධාන කිසිවක් උල්ලංගණය වන පරිදි කටයුතු කල නොහැකිය.

- නොවැලැක්විය හැකි හේතුවක් නොවේනම් අවම වශයෙන් මාස තුනකට වරක්වත් විධායක මණ්ඩලය රැස්විය යුතුය.

- විධායක මණ්ඩලයේ රැස්වීම් කැඳවීම ,වාතර්ා තබා ගැනීම හා ඒ සම්බන්ද සියලු ලේඛන පවත්වා ගැනීමේ බලතල හා වගකීම සංගමයේ ගරු ලේකම් වරියට පැවරේ.

- සංගමයේ සියලු මුල්‍ය කටයුතු ,මුදල් ගණුදෙණු ,බැංකු තැන්පතු ,ජංගම ගිණුම් පිලිබඳ වගකීම්,සංගමයේ ගරු භාණ්ඩාගාරිකවරිය විසින් දැරිය යුතුය.මුල්‍ය කටයුතු වලට සම්බන්ධ පොත්පත් ලෙජර් ,ලේඛන ,ලිපිගොනු,හා වාතර්ා නිවැරදිව අංග සම්පුණර්ව හා යාවත්කාලීනව පත්වා ගෙන යාමේ වගකීමද විධායක මණ්ඩලයට ,මහා සංගමයට හා අදාළ වෙනත් ආයතන වලට අවශ්‍ය මුල්‍ය වාතර්ා හා තොරතුරු,සැපයීමේ වගකීමද ,අභ්‍යන්තර විගණන කටයුතු පවත්වා ගැනීමද වාෂර්ික විගණනය,මුදල් වෂර්ය ඉකුත්වී දින 60ක් ඇතුලත සම්පුණර් කර වාතර්ා කිරීමේ වගකීමද සංගමයේ ගරු භාණ්ඩාගාරිකවරියට පැවරේ.මුල්‍ය පුරෝකථනය ,මුල්‍ය සැලසුම් සකස් කිරීම ඉදිරි වෂර්ය සඳහා අයවැය ලේඛන සකස් කිරීම,ඒවා ක්‍රියාත්මක කිරීම හා ප්‍රගති පාලනය නොපිරිහෙලා ඉටු කිරීම සංගමයේ ගරු භාණ්ඩාගාරික වරියගේ අධීක්ෂණය හා මග පැනවීම යටතේ සිදුවිය යුතුය.

- ආබාධ සහිත කාන්තාවගේ සංගමයේ උපදේශක තනතුර නම් කිරීම විධායක මණ්ඩලය සතුය.විධායක මණ්ඩලය විසින් නම් කරන ලද උපදේශකවරයා සඳහා මහා සභාවේදී අනුමැතිය ලබා ගත යුතුවේ.

- සංගමයේ මුදල් සම්බන්ධ සියලු තීරණ ගැනීම විධායක සභාව සතුය.එම තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා විධායක අධ්‍යක්ෂකවරියට බලය පැවරීමට විධායක සභාවට බලය ඇත.

- විධායක මණ්ඩලයේ සන පුණර්ය 1/2 ක බලයක් තිබිය යුතුය.

- රැස්වීම් වාර තුනකට සහභාගී නොවුවහොත් තනතුර අහෝසි වනු ඇත.

- විධායක මණ්ඩලයේ රැස්වීම්වලදී ගනු ලබන තීරණ සම්බන්ධව විධායක මණ්ඩල සාමාජිකාවන් සියලු දෙනාම සාමුහිකව වග කිව යුතුය.ව්‍යවස්ථාව සම්මත කර ගන්නා අවස්ථාවේ සිටි විධායක මණ්ඩලයේ සාමාජිකාවන් හැර ඉදිරියට විධායක මණ්ඩලයේ සාමාජිකාවන් තෝරා ගැනීමේදී සාමාජිකත්වය ලබා වසර දෙකකවත් පළපුරුද්දක් අවශ්‍යවේ.අවශ්‍යතාවයන් අනුව ඉදිරියේදී ආබාධ නොවන කාන්තාවන් තිදෙනෙකුටද ඉහත කී සභිකයන්ට අමතරව විධායක මණ්ඩලයට ඇතුලත් විය හැක.එම දෙදෙනා නම් කිරීම විධායක මණ්ඩලයේ එකග තාවය අනුව සිදු කල හැක.

- සංගමයේ කටයුතු පවත්වාගෙන යාම සඳහා කායර්ාලයක් පවත්වා ගත යුතු අතර එම කායර්ාලයේ පාලනය ගරු සභාපතිනිය ප්‍රමුඛ විධායක මණ්ඩලය වෙත පැවරේ.එම කායර්ාලයේ කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සේවක සේවිකාවන් බඳවා ගැනීමට එක් එක් තනතුරු වෙනුවෙන් සේවා විස්තරයක් සකස් කර එය පැවරීමට,සේවා කොන්දේසි පැනවීමට දීමනා හා

වැටුප් තීරණය කිරීමට විධායක මණ්ඩලයට බලය පැවරේ.එම තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා විධායක අධ්‍යක්ෂකවරියට බලය පැවරීමට විධායක සභාවට බලය ඇත.

- සංගමයන් පවත්වා ගෙන යනු ලබන ආයතනයේ සේවය සඳහා සේවක සේවිකාවන් බඳවා ගත යුත්තේ කොන්ත්‍රාත් පදනම මතය.අවශ්‍යතාවය අනුව විධායක සභිකාවකටද සාමාජිකාවක්ටද කායර්ාල කටයුතු සඳහා තනතුරු දැරිය හැකිය. එම සේවා කාලය තුල සේවයට අදාල කොන්දේසි වලට ඇයට බලපෑම් කල නොහැකිය. එමෙන්ම සංගමයේ නිලතල සමග සසඳමින් කටයුතු නොකළ යුතු අතර එම සේවා කාලය තුලදී විධායක අධ්‍යක්ෂක වරියගේ විධානයන්ට යටත් විය යුතුය.

- සංගමයේ පොදු පරිපාලන කටයුතු මෙහයවීම සඳහාත් ක්‍රියාත්මක කිරීම සඳහාත් විධායක අධ්‍යක්ෂකවරියෙකු බඳවා ගැනීමට විධායක මණ්ඩලයට බලය පැවරේ.බඳවා ගනු ලබන විධායක අධ්‍යක්ෂකවරිය මාසිකව සේවය කලයුතු දින ගණන් හා කාල සීමාවන් තීරණය කිරීමටද විධායක මණ්ඩලයට බලය පැවරේ.දින 30ක කාලයකට පෙර දැනුම් දීමක් මගින් විධායක අධ්‍යක්ෂක තනතුර දරන්නාගේ සේවය අහෝසි කිරීමටත් ඒ අනුව නිසි දීමනාවක් හෝ වැටුපක් නොගෙවා සිටීමටත් විධායක මණ්ඩලයේ බලය පැවරේ.විධායක අධ්‍යක්ෂක්වරියගේ කිසියම් කිසියම් සේවා වකවානුවක් සේවය අගය කිරීමක් වෙනුවෙන් කිසියම් පාරිතෝෂිත මුදලක් ගෙවීමට සේවයෙන් ඉවත් කිරීම් බාධාවක් නොවිය යුතුය.
- සෑම දෙවසරකට වරක් පැවැත්වෙන මහා සභා රැස්වීම් නිලවරණයේදී විධායක මණ්ඩලයේ සියලු
විධායක සභිකාවන් ඉල්ලා අස්විය යුතු අතර එදින නව නිලධාරී මණ්ඩලයක් පත් කර ගැනීමට මහා සභාවට බලය පැවරේ.
- සංගමය වෙනුවෙන් රජයේ හෝ වාණිජ බැංකුවල ගිණුම් පවත්වා ගැනීමට විධායක මණ්ඩලයට හැකිය.එම ගිණුම් මෙහෙයවීමේ බලය ගරු සභාපති ,ලේකම්, හෝ භාණ්ඩාගාරික තනතුරු දරන්නන් වෙත පැවරේ.චෙක් පත් නිකුත් කිරීමේදී පළමු අත්සන ගරු සභාපතිගේද දෙවන අත්සන ගරු භාන්ඩාගාරිකගේ හෝ ගරු ලේකම්ගේද විය යුතුය.
- සංගමය සඳහා දේශීය හා විදේශීය ආයතනවලින් ලැබෙන ප්‍රදාන භාර ගැනීමට ඒවා වියදම් කරනආකාරය තීරණය කර ගැනීමට හා සංගමය වෙනුවෙන් ගිවිසුම් වලට එළඹීමටත් දේපල අත්පත් කර භාර ගැනීමටත් විධායක සභාවට බලය පැවරේ.
- සංගමයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා දිස්ත්‍රික් මට්ටමේ සමායෝජකවරියක් සහ සංවිධායකවරියක් ද ප්‍රාදේශීය මට්ටමේ,ග්‍රාමීය මට්ටමේ මැදිහත් කරුවන්ද ,දිස්ත්‍රික් මට්ටමේ සම්පත්දයකයන්ද තෝරාගෙන.සේවයේ අනුයුක්ත කිරීමටත් ඔවුන් සංගමයේ කටයුතු සඳහා දරනු ලබන සාධාරණ වියදම්ද දීමනාද ගෙවීමට විධායක සභාවට හැකිය

- සංගමය වෙනුවෙන් බාහිර ආයතනවලින් හා බැංකුවලින් ණය මුදල් අයිරා පහසුකම් ලබා ගැනීමට විධායක සභාවට බලය පැවරේ. සංගමය හා සංගමයට සම්බන්ධ දිස්ත්‍රික්, ප්‍රාදේශීය සහ ග්‍රාමීය සංවිධාන වෙනුවෙන් ආපදා රක්ෂණ අරමුදල් සහ වෙනත් අරමුදල් පිහිටුවීමටත් ඒවා පවත්වාගෙන යාමටත් විධායක සභාවට හැකිය.

- ගරු සභාපති,ලේකම් හෝ භාණ්ඩාගාරික පිළිගත හැකි හේතුවක් නොමැතිව නොකඩවා විධායක සභාවේ රැස්වීම් වලට වාර තුනක් සහභාගි වීමට අසමත් වුවහොත් ,නොදන්වා රැස්වීම් වාර දෙකකට සහභාගී නොවුවහොත් එම සභික වරියන් වෙනුවෙන් අදාල වන පරිදි උප සභාපති,උප ලේකම් හෝ උප භාණ්ඩාගාරික එම පුරප්පාඩු තනතුරු සඳහා පත් කර ගැනීමට විධායක සභාවට බලය ලැබේ. නැවත මහා සභා රැස්වීමක් පවත්වා නිල මඩුල්ලක් පත් කර ගන්නා තෙක් එම පත්වීම වලංගු හා බල සහිත විය යුතුය.එසේ පත් කර ගන්නා තනතුරු සඳහා බැංකු ගිණුම් වලට අත්සන් කිරීමේ බලය ඇත.

19,ගරු සභාපතිගේ වගකීම් :-

- විධායක මණ්ඩලයේ සහ මහා සභා රැස්වීම් මුලසුන දැරීම.එම රැස්වීම් මෙහයවීම හා රැස්වීම් තීරණ ක්‍රියාත්මක කිරීම ආකාස ආයතනය පවත්වා ගෙන යාම සඳහා මහා සභාව ගන්නා තීරණ ක්‍රියාත්මක කිරීමෙ වගකීම සංගමයේ ගරු සභාපතිනිය වෙත පැවරේ .

20,ගරු ලේකම්ගේ වගකීම :-

- විධායක මණ්ඩලයේ රැස්වීම් කැඳවීම ,වාතර්‍ා තබා ගැනීම.හා ඒ සම්බන්ධ සියළු ලේඛන පවත්වා ගැනීමේ බලතල හා වගකීම සංගමයේ ගරු ලේකම්වරියට පැවරේ.
- මහා සභා රැස්වීම් කැඳවීම ගරු සභාපතිගේ උපදෙස් මත ගරු ලේකම් වරිය විසින් කලයුතුය.සියලු මහා සභා රැස්වීම්වල වාතර්‍ා තබා ගැනීම,වාතර්‍ා බෙදා හැරීම,හා ප්‍රසිද්ධ කිරීම ගරු ලේකම් වරිය විසින් කලයුතුය.

20,ගරු භාණ්ඩාගාරිකගේ වගකීම්

- සංගමයේ සියලු මූල්‍ය කටයුතු ,මුදල් ගණුදෙනු බැංකු තැන්පතු,ජංගම ගිණුම් පිලිබඳ වගකීම්,සංගමයේ ගරු භාණ්ඩාගාරිකවරිය විසින් දැරිය යුතුය.මූල්‍ය කටයුතු පිලිබඳ පොත්පත් ලෙජර් ,ලේඛන,ලිපි ගොනු හා වාතර්‍ා නිවැරදිව,අංග සම්පූණර්ව හා යාවත්කාලීනව පවත්වා ගැනීමේ වගකීමද,විධායක මණ්ඩලයට මහා සංගමයට හා අදාළ වෙනත් ආයතනවලට අවශ්‍ය මූල්‍ය වාතර්‍ා හා තොරතුරු සැපයීමේ වගකීමද අභ්‍යන්තර විගණන කටයුතු පවත්වා ගැනීමද වාෂර්ික විගණනය මුදල් වෂර්ය ඉකුත්වී දින 90ක් (දින අනුවක්)ඇතුලත සම්පූණර් කර වාතර්‍ා කිරීමේ වගකීමද සංගමයේ ගරු භාණ්ඩාගාරික වරියට පැවරේ.මූල්‍ය පුරෝකථනය ,මූල්‍ය සැලසුම් සකස් කිරීම.ඉදිරි වෂර්ය සඳහා අයවැය ලේඛන සකස් කිරීම ඒවා ක්‍රියාත්මක කිරීම හා ප්‍රගති පාලනය නොපිරිහෙලා ඉටු කිරීම සංගමයේ ගරු භාණ්ඩාගාරිකවරියගේ අධීක්ෂණය හා මග පෙන්වීම යටතේ සිදුවිය යුතුය.

21,විධායක සභා රැස්වීම්

- නොවැලක්විය හැකි හේතුවක් නොමැත්තේනම් අවම වශයෙන් මස 03කට වරක් විධායක සභාව රැස්විය යුතුය.
- විධායක සභාවේ සන පූණර්ය ½කි. (50%)

22,විධායක අධ්‍යක්ෂිකාව සඳහා සුදුසුකම් :-

- අබාධ සහිත කාන්තාවක් විය යුතුය.
- අවම වශයෙන් අවුරුදු 07ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් අබාධ සහිත වුවන් සඳහා සේවය කර ක්ෂේත්‍රය පිලිබඳ පළපුරුද්දක් තිබිය යුතුය.
- සංඥා භාෂාව පිලිබඳ දැනීමක් තිබිය යුතුය.
- විධායක සභාවේ සාමාජික විය යුතුය.
- බාහිර ආයතන සමග සම්බන්ධතා පවත්වා ගනීමේ හැකියාව තිබිය යුතුය.
- මෙම ක්ෂේත්‍රයේ ජාතික හා ජාත්‍යාන්තර පිලිගැනීමකට ලක්ව තිබීමද අමතර සුදුසුකමකි.

23,විධායක අධ්‍යක්ෂකවරියගේ බලතල

- ආයතනික පරිපාලනය.
- ආයතනයේ සියලු කටයුතු අධීක්ෂණය.
- මුදල් සම්බන්ධ වගකීම (අත්සන් කිරීම)
- හදිසි අවස්ථාවල ක්ෂණික තීරණ ගත හැකිය.(විධායක මණ්ඩලයේ අනුමැතියට යටත්ව තාවකාලික තීරණ)
- සංගමය මගින් ක්‍රියාත්මක කරනු ලබන සෑම ව්‍යාපෘතියකම වගකීම ,ක්‍රියාත්මක කරවීම,අධීක්ෂණය කිරීම විධායක අධ්‍යක්ෂිකාව සතුය.
- කලින් කලට අවශ්‍ය කායර් මණ්ඩලය බඳවා ගැනීමේ බලතල හිමිවේ.
- සංගමය මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිවල සම්බන්ධීකාරක වශයෙන් කටයුතු කිරීම.

24,විධායක අධ්‍යක්ෂකවරියගේ නිලය අවසන්වීම.

- සංගමයේ දඬුවම් ලැබිය හැකි විනය විරෝධී කටයුතු නිසා.
- සිය කැමැත්තෙන් ඉවත්වීම.

25,භාරකාර මණ්ඩලය

- නිශ්චල චංචල දේපල භාර ගැනීම,නිසි පරිදි පරිහරණය කිරීම හා විකුණා දැමීමේදී බලය සහිත භාරකාර මණ්ඩලයක් සිටිය යුතුය.එය මහා සභාවෙන් නම් කරන ලද 5දෙනෙකුගෙන් සමන් විය යුතුය.එහි සංයුතිය විධායක මණ්ඩලයේ තිදෙනෙක් හා ආයතනික කළමනාකරණ හා බුද්ධිමණ්ඩලයේ අයෙකු වශයෙනි.
- නිශ්චල හා දේපල විකුණා දැමීමේදී භාරකාර මණ්ඩලය විසින් විධායක මණ්ඩලයේ අනුමැතිය ලබා ගතයුතුය.

26,මුදල්

- සංගමය වෙනුවෙන් රජයේ හෝ වාණිජ බැංකුවල ගිණුම් පවත්වා ගැනීමට විධායක මණ්ඩලයට හැකිය.එම ගිණුම් මෙහයවීමේ බලය ගරු සභාපති හා ලේකම් හෝ භාණ්ඩාගාරික තනතුරු දරන්නන් වෙත පැවරේ.චෙක් පත් නිකුත් කිරීමේදී පළමු අත්සන ගරු සභාපතිනිගේද,
දෙවන අත්සන ගරු භාණ්ඩාගාරික හෝ ලේකම් ගේද විය යුතුය.
- සංගමය වෙනුවෙන් මුදල් රැස් කිරීමට හා වියදම් දැරීමට විධායක මණ්ඩලයේ එකඟතාවය ලබා ගත යුතුය.වියදම් දැරීම සහ මුදල් රැස් කිරීම සඳහා අනුමත කිරීම,පරීක්ෂා කිරීම,හා සහතික කිරීම යන බලතල ගරු,සභාපති ,ලේකම් ,භාණ්ඩාගාරික යන තිදෙනාට පැවරේ.
- ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක වන රජයේ හා පෞද්ගලික පහත සඳහන් බැංකුවල මුදල් තැන්පත් කිරීමට ව්‍යවස්ථානුකූලව බලය පැවරේ.ලංකා බැංකුව,මහජන බැංකුව,සෙලාන් බැංකුව,සම්පත් බැංකුව,හැටන් නැෂනල් බැංකුව,ඩී.එෆ්.සී සී බැංකුව,කොමෂල් බැංකුව.
- සංගමයේ අවශ්‍යතා අනුව පිළිගත් මූල්‍ය ආයතනවලින් නය ගනුදෙනු කල හැක.
- මූල්‍ය ආයතනවලින් ගනු ලබන ණය හෝ උගස් වූ දේපල නිරාකරණය කිරීම සභාපති,ලේකම්,භාණ්ඩාගාරික යන තනතුරු දරන්නන් සිය නිල කාලය තුල සිදු කල යුතුය.
- යම් හෙයකින් සිය නිලකාලය තුල එය සිදුකිරීමට නොහැකි වුවහොත් නැවත පත්වන අනුප්‍රාප්තික නිලධාරීන් විසින් එහි වගකීම දැරිය යුතුය.
- මූල්‍ය ආයතනයකින් ණය ලබා ගැනීමේදී සභාපති, ලේකම්, භාණ්ඩාගාරික යන තිදෙනාගේ එකඟතාවය හා අත්සන් යෙදීම මත කලයුතුය.

27,මුදල් වර්ෂය.

- ආබාධ සහිත කාන්තාවන්ගේ සංගමයේ මුදල් වෂර්ය ජනවාරි මස පළමු වෙනිදායින් (1වනදා) ආරම්භවී එම වෂර්යේ දෙසම්බර් 31 වනදායින් අවසන්වේ.එම මුදල් වෂර්ය ගිණුම් වාතර්ා පිළියෙළ කිරීම,ඉදිරි වැඩසටහන් පිළියෙළ කිරීමට හා වාෂර්ික ප්‍රගති සමාලෝචනයට වලංගු විය යුතුය.

28,උපදේශක තනතුර සඳහා සුදුසුකම්.

- ස්ත්‍රී ,පුරුෂ බේදයක් නොමැත.
- ආබාධ සහිත පුද්ගලයන් හා එම ක්ෂේත්‍රය පිලිබඳ පුළුල් දැනුමක් ඇති අයෙකු වීම.
- ආබාධ සහිත පුද්ගලයන්ගේ විශේෂයෙන් ආබාධ සහිත කාන්තාවන්ගේ අයිතීන් ලබා ගැනීමේදී ක්‍රියාකාරී පුද්ගලයෙකු ලෙස කටයුතු කර තිබීම.
- මනා ඉංග්‍රීසි දැනුමක් තිබිය යුතුය.
- පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා ගෙන තිබීම.

29,උපදේශකවරයාගේ කාර්ය භාර්යය

- සංගමය අනුග්‍රහ ආයතන සමග සම්බන්ධිත පැවැත්වීමේදී සහය වීම.
- සංගමයේ පරිපාලන කටයුතුවලදී සහය ලබාදීම සහ අවශ්‍ය අවස්ථාවලදී උපදෙස් ලබාදීම.

30,තනතුර අහෝසිවීම.

- නීති විරෝධී ක්‍රියා හා සංගමයේ විනය විරෝධී ක්‍රියා සිදු කිරීම.
- සිය කැමැත්තෙන් ඉල්ලා අස්වීම.

31,මහා සභාව

- මහා සභාව සඳහා ඍජු සාමාජිකයන්ට,ප්‍රතිලාභී සාමාජිකයන්ට,ආබාධ සහිත කාන්තාවන්ගේ භාරකරුවන්ට හා ආරාධිත අමුත්තන්ට පමණක් සහභාගී විය හැක.
- යෝජනා ස්ථිර කිරීම් හා ජන්දය පාවිච්චි කිරීම ඍජු සාමාජිකයන්ට හා ප්‍රාදේශීය සංවිධානවල විධායක මණ්ඩලයේ අයට හා ප්‍රතිලාභී සාමාජිකයන්ට පමණක් කල හැකිය.
- තීරණ ගැනීමේ බලය ඍජු සාමාජිකයන් වෙත හිමිවේ.
- අවම වශයෙන් අවුරුදු 2කට වරක්වත් මහා සභාව රැස්විය යුතුය.මහා සභා රැස්වීමේදී මහා සංගමයේ විධායක මණ්ඩලය තෝරා ගත යුතුය.
- පසුගිය වසරවල ගිණුම් වාතර්ා ඉදිරිපත් කර සම්මත කර ගැනීමත් ,එම වෂර්වල ප්‍රගති වාතර්ා ඉදිරිපත් කිරීමත් මහා සභා රැස්වීමේදී කල යුතුය.
- විධායක මණ්ඩලය විසින් ගනු ලැබූ කිසියම් තීරණයක් ස්ථිර කිරීමට, අවලංගු කිරීමට සංසෝධනය කිරීමට හා ඒ වෙනුවෙන් වෙනත් තීරණයක් ගැනීමට මහා සභාවට හැකිය.
- මහා සභා රැස්වීම බල සහිත වීමට නම් මුළු සාමාජික සංඛ්‍යාවෙන් 1/3 හෝ සාමාජිකාවන් 30ක් හෝ විය යුතුය.
- යම් මහා සභා රැස්වීමකට සන පූර්ණය ප්‍රමාණවත් නොවීම නිසා විධායක මණ්ඩලය පත් කර ගැනීමට නොහැකි වුවහොත් මාසයක ඇතුලත නැවත මහා සභාව කැඳවා විධායක මණ්ඩලය පත් කර ගත යුතුය.එතෙක් පැරණි විධායක මණ්ඩලයටම කටයුතු කල හැක.
- මුළු සාමාජික සංඛ්‍යාවෙන් 1/3 ක සංඛ්‍යාවක් විසින් අත්සන් කරන ලද ලිඛිත ඉල්ලීමක් මගින් මහා සභාව රැස් කරන ලෙස ගරු ලේකම් වරිය වෙත දැනුම් දුනහොත් ලේකම් වරිය විසින් 20ක් ඇතුලත මහා සභාව රැස් කරවිය යුතුය.එවැනි ඉල්ලීමක් කල බව තහවුරු කර ගැනීමට
  එකී සාමාජික පිරිසට අවශ්‍ය නම් එම ඉල්ලීමේ පිටපතක් ලිපියේ සඳහන් දින සිට දින 07ක් ඇතුලත බුද්ධි මණ්ඩලයේ සාමාජිකයෙකු වෙත ඉදිරිපත් කල හැකිය.
- සංගමයේ කටයුතු සඳහා උපදෙස් හා මග පෙන්වීම උදෙසා බුද්ධි මණ්ඩලයක් පත් කර ගැනීමටත් බුද්ධි මණ්ඩලයේ සංඛ්‍යාව තීරණය කිරීමටත් මහා සභාවට බලය ඇත.

අතුරු ව්‍යවස්ථාව

මෙම සංගමයේ සාමාජිකත්වය දරණ සියලුම ආකාරයේ සංවිධාන හා කුඩා කණ්ඩායම් වෙනුවෙන් බල පැවැත්වෙන අතුරු ව්‍යවස්ථාව පහත ආකාරයෙන් පිළිගනු ලැබේ.

1, කුඩා කණ්ඩායම්

භෞතික ලක්‍ෂණ

- සාමාජිකයන් උපරිම 10ක් වන අතර අවමය 05කි.
- නිතරම මුණ ගැසෙන හා මුණ ගැසීමට පහසු අයවලුන් වීම.
- පුද්ගලික ගැටළු සාකච්ඡා කිරීමට හැකි අයවලුන් වීම.
- එකිනෙකාට උදවු කර ගැනීමට හැකි අය වීම.

භෞතික නොවන ලක්‍ෂණ

- මිත්‍රත්වය.
- එකමුතුකම
- එකිනෙකා අතර විශ්වාසය
- අන්‍යෝන්‍ය සහයෝගය

2,නායකත්වය

- මාස 06කට වරක් නායකයෙකු පත් විය යුතුය

3,සාමාජික වගකීම.

- කණ්ඩායම් තුල එක්සත්භාවය ආරක්ෂා කල් යුතුය.
- නායකත්වයට සහයෝගය ලබා දිය යුතුය.
- සාමාජික මුදල් නිසි පරිදි ලබා දිය යුතුය.

4,නායකත්ව වගකීම

- ග්‍රාමීය සංවිධානයට වගකිව යුතු වේ.
- සාමාජිකයන්ගේ ගැටළු නිතර සොයා බලා ග්‍රාමීය සංවිධාන දැනුවත් කල යුතුය.
- කණ්ඩායම අදාල දිනවල රැස් කර ගැටළු සාකච්ඡා කල යුතුය.

5,ග්‍රාමීය සංවිධාන

සංයුතිය

- කුඩා කණ්ඩායම් නායකයන්ගෙන් සමන්විය යුතුය.

6,සාමාජිකත්වය

- සියලුම කුඩා කණ්ඩායම් සාමාජිකයන්

7,විශාලත්වය

- කුඩා කණ්ඩායම් 05 සිට 10 දක්වා

8,නිලධාරීන්

- සභාපති,ලේකම්,භාණ්ඩාගාරික.

9,වගකීම

සභාපති

- සභාව මෙහයවයි.
- ආබාධ සහිත කාන්තාවන්ගේ සංගමය සමග ඍජු සම්බඳතා පවත්වයි.
- ග්‍රාමීය සංවිධාන නිතර අවධියෙන් තබා ගැනීමට කටයුතු කරයි.

ලේකම්,

- වාතර්ා හා ලේඛන පවත්වාගෙන යා යුතුය.
- සභාපතිගේ අනුදැනුම ඇතිව ග්‍රාමීය සංවිධාන කැඳවිය යුතුය.
- සභාව කැඳවීමට දින 07කට පෙර ඒ බව ලිඛිතව සාමාජිකයන්ට දැනුම් දිය යුතුය.
- ආබාධ සහිත කාන්තාවන්ගේ සංගමය සමග ඍජු සම්බඳතා පවත්වයි.

භාණ්ඩාගාරික

- මූල්‍ය කටයුතු සිදුකළ යුතුය.
- සාමාජික මුදල් රැස් කල යුතුය.
- සිය ව්‍යාපාර ප්‍රජාවගේ ව්‍යාපාර කටයුතු අධීක්ෂණය හා ව්‍යාපාරිකයන්හට ලබා දෙන ණය මුදල් කටයුතු අධීක්ෂණය කර මවු ආයතනය දැනුවත් කල යුතුය.

10,ග්‍රාමීය සංවිධාන රැස්වීම්

- කුඩා කණ්ඩායම් තුල සිය සාමාජිකයන්ට විසඳා ගැනීමට අපහසු ගැටළු සාකච්ඡා කරයි.
- අත්දැකීම් බෙදා ගැනීමට කටයුතු කරයි
- කුඩා කණ්ඩායම් සහ ග්‍රාමීය සංවිධානය ශක්තිමත් කරගැනීමට නිරන්තර ක්‍රියා මාගර් සාකච්ඡා කල යුතුය.
- ගැටළු නිරාකරණය කිරීමට අවශ්‍ය දැනුම ලබා ගත යුතුය.

11,රැස්වීම් පැවැත්වෙන දිනය

- සෑම මසකම අවසාන සතියේ සම්මත කර ගත් දිනක රැස්වීම පැවැත්වේ.
- දින තීරණය පෙර සභා වාරයේදී තීරණය කල යුතුය.
- අවශ්‍යතාවය පරිදි අකාසය තීරණය කරන දිනක හදිසි මහා සභා කැඳවීමට ලේකම්ට හැකියාව ඇත.

12,ප්‍රාදේශීය සංවිධාන

- මෙම සංවිධානය ආකාසයට අනුබද්ධ ප්‍රාදේශීය සංවිධානයයි

13,සංයුතිය.

- ග්‍රාමීය සංවිධාන නිලධාරීන්

14,සාමාජිකත්වය.

- සියලුම කුඩා කණ්ඩායම් සාමාජිකයින්

15,විශාලත්වය.

- සියලුම ග්‍රාමීය සංවිධාන

16,නිලධාරීන්

- සභාපති , ලේකම් , භාණ්ඩාගාරික

17,කාරක සභාව

- අදාළ ප්‍රාදේශීය සංවිධාන බල ප්‍රදේශයට ග්‍රාම නිලධාරී වසම්වල නියෝජිතයින්

18,නිල කාලය

- වසරකට වරක් නිලවරණය පැවැත්විය යුතුය.

19,වගකීම්

සභාපති

- සභාව මෙහයවිය යුතුය.
- ප්‍රාදේශීය සංවිධාන,ග්‍රාමීය සංවිධාන කුඩා කණ්ඩායම් නිරන්තර අවධියෙන් තබා ගනීජ්මට කටයුතු කල යුතුය.
- කුඩා කණ්ඩායම් ග්රාමීයා සංවිධාන ඇති කිරීමට ආකාස සහය ඇතිව කටයුතු කල යුතුය.
- ආකාස සමග ඍජු සම්බන්ධතා පැවැත්වීම සඳහා කටයුතු කල යුතුය.
- දිස්ත්‍රික් සංවිධානය වෙත වගකීමට බැදී සිටිය යුතුය.

ලේකම්,

- වාතර්ා හා ලේඛන නිසි පරිදි පවත්වාගෙන යා යුතුය.
- සභාපතිගේ අනුදැනුම ඇතිව සභාව කැඳවිය යුතුය.
- සභාව පැවැත්වීමට දින 07කට පෙර ඒ බව ලිඛිතව සාමාජිකයන්ට දැනුම් දිය යුතුය.
- කුඩා කණ්ඩායම් ග්‍රාමීය සංවිධාන බිහි කිරීමෙහිලා ආකාසයේ සහය ගෙන කටයුතු කල යුතුය.
- ආකාසය සමග ඍජු සම්බන්ධතා පැවැත්විය යුතුය.

භාණ්ඩාගාරික

- කුඩා කණ්ඩායමේ සිට ග්‍රාමීය සංවිධාන හරහා සාමාජික මුදල් රැස් කර බැංකු ගත කලයුතුය.
- ආකාසය හරහා සාමාජිකයන් වෙත පිරිනැමෙන ණය ආධාර වක්‍රීය වැඩ සටහනට සක්‍රියව දායක විය යුතුය.
- ප්‍රාදේශීය සංවිධාන අරමුදල ශක්තිමත් කර ගැනීමට කටයුතු කල යුතුය.
- ගිණුම් කටයුතු යාවත්කාලීනව පවත්වාගත යා යුතුය.

20,කාරක සභික

- කාරක සභිකයන් තමන නියෝජනය කරන ග්‍රාමසේවා වසම තුල වෙසෙන ආබාධ සහිත පුද්ගලයන් සංවිධානය කිරීම කල යුතුය.
- කුඩා කණ්ඩායම් රැස්වීම් පිළිබඳව නිරන්තරව සොයා බලමින් ඒවා මෙහයවීම කල යුතුය.

21,ප්‍රාදේශීය සංවිධාන රැස්වීම්

- සැම මසකම තීරණය කර ගත් දිනයක පැවැත්විය යුතුය.

- සාමාජික ගැටළු නිරාකරණයට අවශ්‍ය පියවර සාකච්චා කිරීම කල යුතුය.
- ග්‍රාමීය සංවිධාන සජීවිව පවත්වා ගෙන යාමට කටයුතු කල යුතුය.
- සියලුම ක්‍රියාකාරකම් සජීවීකරණය සඳහා නව යෝජනා පිලිබඳ සාකච්චා කල යුතුය.

22,මහා සභා රැස්වීම.

- සෑම වසඅර්කට වරක් පැවැත්විය යුතුය.
- අවශ්‍යතාවය අනුව ආකාසය තීරණය කරන දිනයක මහා සභාව කැඳවිය යුතුය.

23,අරමුදල

- "ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ" නමින් අබාධ සහිත කාන්තාවන්ගේ අරමුදල යනුවෙන් හැඳින්වේ.
- බැංකු ගිණුම ආරම්භ කිරීමේදී ව්‍යවස්ථා පිටපතක් මවු සංවිධානයේ සභාපති භාණ්ඩාගාරික හෝ ලේකම් යන අයගෙන් එක අයෙකුගේ අත්සන හා ප්‍රාදේශීය සංවිධානයේ සභාපති,ලේකම්,භාණ්ඩාගාරික යන තිදෙනාගේ ආදශර් අත්සන් හා සමිතියේ රබර් මුද්‍රාව ඉදිරිපත් කල යුතුවේ.
- මුදල් ලබා ගැනීමේදී බලය ප්‍රාදේශීය සංවිධානයේ භාණ්ඩාගාරික හා ලේකම් හෝ සභාපති යන දෙදෙනාගෙන් එක අයෙකුගේ සහ මවු සංවිධානයේ නියෝජිතයාගේ අත්සනින් යුතුව කලයුතුවේ.

24,මුදල් වර්ෂය

- මවු සංගමයේ මුදල් වෂර්ය පරිදි ජනවාරි මස පලමුවෙනිදායින් ආරම්භවී දෙසැම්බර් මස 31 වනදායින් අවසන් වේ එම මුදල් වෂර්ය ගිණුම් වාතර්ා පිළියෙළ කිරීම ,ඉදිරි වැඩ සටහන් සකස් කිරීම හා වාෂරීක ප්‍රගති සමාලෝචනයට වලංගු විය යුතුය.